**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I) - 2022**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක 47037- එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතට අනුව, විදුලිබල අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ හා ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ජලවිදුලි උත්පාදනය සංවර්ධනය සහ පද්ධතියට සම්බන්ධ කිරීම, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව වැඩි දියුණු කිරීම, මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඉල්ලුම් කළමණාකරණය සහ ධාරිතා සංවර්ධන සහාය සැපයීම යන සංරචක 5ක් යටතේ වැඩසටහනේ කටයුතු සමන්විත වේ. පහසුකම් පරිපාලන අත්පොතට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 28,515.03 කට සමාන වූ එජඩො මිලියන 220 වන අතර ඉන් රු. මිලියන 23,330.48 කට සමාන වූ එජඩො මිලියන 180 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ප්‍රංශ නියෝජිත ආයතනය (AFD) සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 5,184.55 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර, 2019 සැප්තැම්බර් 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2024 ජූලි 13 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 වගුවේ විස්තර කර ඇති කරුණු සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු ලබයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුවේ සහ ප්‍රංශ නියෝජිත ආයතනයේ ණය ශේෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -21 අනුව වාර්තා කළ දිනයේ ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ශාඛා ගිණුම් කට්ටලයක් ලෙස ව්‍යාපෘති ගිණුම් ක්‍රමවත්ව දැක්වීම ලංකා විදුලිබල මණ්ඩලයේ භාවිතය වේ. මෙය ඉතිහාසය පුරාවටම විගණකවරුන් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිසි ලෙස පිළිගෙන ඇති අතර මෙතෙක් කිසිදු විමසීමක් සිදුකර නොමැත. අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ සාමාන්‍යයෙන් පිළිගත් මූලධර්මවලට අනුකූලව ණය විසර්ජනය සහ අදාළ වත්කම් ඉදිකිරීම වාර්තා කරන අතරතුරය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සියලුම ගනුදෙනු පොදු ලෙජරයේ සටහන් කර ඇත. අදාළ ණය මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීමට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු විසින් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සහ පියවීම සිදු කරනු ලබයි. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ පොදු ලෙජරය යටතේ ණය සටහන් කර ඇත. | |
| (ආ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ රජය විසින් දරන ලද රු.මිලියන 285.6 ක් සහ රු.මිලියන 46.6 ක් වූ පොලී සහ බැඳීම් ගාස්තු වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. | හරිත බලශක්ති සංවර්ධන බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ අදියර 1 සඳහා ADB ණය අංක 3147 - එස්ආර්අයි මගින් අරමුදල් සපයනු ලැබේ. ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව මෙම විශේෂිත ණය ගිවිසුමට එළඹ ඇත. එබැවින් මෙම ණය මුදලට අදාළ බැඳීම් ගාස්තු සහ පොලී මුදල් අමාත්‍යාංශය විසින් ගෙවනු ලබන අතර මුදල් අමාත්‍යාංශය සමඟ නිසි එකඟතාවයකින් තොරව ව්‍යාපෘතියේ පිරිවැය ලෙස ගිණුම්ගත කළ නොහැක.අප විසින් මෙය ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ගිණුම් ගත කරන්නේ නම්, ජාතික ගිණුම් ද්විගණනය වනු ලැබේ. | සුදුසු ගිණුම්කරණ පිළියම් යෙදීම හෝ අදාළ තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී අංක 3146 දරණ ණය ගිවිසුම යටතේ ලද රු.මිලියන 11.9 ක ණය විසර්ජනයන් තුනක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පාරිසරික හා සමාජ බලපෑම් ඇගයීම සඳහා පුනරීන් සුළං සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය සඳහා යොදාගෙන තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය විසර්ජනයන් සහ ඊට අනුරූප වියදම් වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වී නොතිබුණි. | පාරිසරික හා සමාජීය බලපෑම් තක්සේරුව සඳහා පුනරීන් සුළං සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර එය වෙනම ආයතනයක් බැවින් ලංකා විදුලිබල මණ්ඩලය ඒ සමග ඒකාබද්ධ කළ නොහැක. එබැවින් ලංකා විදුලිබල මණ්ඩලයේ ගණුදෙණු පමණක් ණයට එදිරිව සටහන් කරන ලදි. | ණයට අදාළ සම්පූර්ණ විසර්ජනය ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල කෙරීගෙන යන වැඩ රු.මිලියන 8,205.8 ක් වූ අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු.මිලියන 8,184.5 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 21.3 ක නොසැසඳුන ශේෂයක් නිරීක්ෂණය විය. | සීමාසහිත කෝයි නිපෝන් සමාගම සඳහා රු.මිලියන 21.3 ක මුදලක් අත්තිකාරම් අරමුදල් ගිණුම හරහා සිදු කරන ලදී. මෙම ගෙවීම අත්තිකාරම් අරමුදල් ගිණුමේ ඒ අනුව ගිණුම්ගත කර ඇත. කෙසේ වෙතත්, අතපසුවීමක් හේතුවෙන් 2022.12.31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල උපචිත ගෙවීම නිවැරදි කර නොමැත. මේ අනුව, ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල එය නිවැරදි කර ඇත. තවද, මෙය 2023 ජනවාරි මස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත. එබැවින් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සඳහා මෙය අදාල නොවේ. | මූල්‍ය ප්‍රකාශනවල වෙනස සැසඳීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්යසාධනය | <br>ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| 01 වන කොටස- ජලවිදුලි උත්පාදනය සංවර්ධනය සහ පද්ධතියට සම්බන්ධ කිරීම | (අ) මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම | | | ආරම්භයේදි 2019 ජූනි වන විට නිම කිරීමට සැලසුම් කලද, එය 2023 නොවැම්බර් වන විට නිම කිරීමට අපේක්ෂා විය. ප්‍රධාන සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තුව (ලොට් ඒ2) එය ආරම්භයේදි සැලසුම්කල නිම කිරීමේ දිනයට පසුව 2019 ඔක්තෝම්බර් 04 වෙනිදා ප්‍රදානය කර තිබුණි.<br>ලොට් ඒ1 සහ ලොට් ඒ2 හි උපදේශන සේවා (ලොට් 3) සඳහා කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් 24 දින ප්‍රදානය කළද, ලොට් ඒ1 සහ ලොට් ඒ2 සඳහා කොන්ත්‍රාත්තුව පිළිවෙලින් 2018 මැයි සහ 2019 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රදානය කර තිබුණි. | උපදේශන සේවා සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. |
| | i. ලොට් ඒ 1 | 80.20 | 75.70 | | |
| | ii. ලොට් ඒ 2 | 50.00 | 38.90 | | |
| | iii. ලොට් බී | 40.00 | 27.10 | | |
| | iv. ලොට් 3 | 83.48 | 83.48 | | |
| | v. ලොට් සී | 100 | 100 | | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** කළමනාකරණයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි

**විගණකගේ නිර්දේශය** අපේක්ෂිත නිම කිරීමේ දිනය වන විට ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| වැඩසටහනේ ක්‍රියාකාරකම් කොටස් 06 කින් සමන්විත වූ අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියලුම දායක අරමුදල් සහිත ව්‍යාපෘතිවල අධීක්ෂණය සඳහා වගකිව යුතු අතිරේක සාමාන්‍යාධිකාරීවරයා වෙනුවට වැඩසටහනේ එවැනි කොටස්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ පරිපාලන කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ විෂය පථය යටතේ පැවත තිබුණි. . | ඒ ඒ අංශයන්ට අදාළ විශේෂඥ දැනුම ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව ලංකා විදුලිබල මණ්ඩලය මෙම ක්‍රියාකාරකම් විවිධ අංශ වලට පවරා ඇත. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩලයේ දැක්ම අනුව, කටයුතු අධීක්ෂණය සහ පරිපාලන කටයුතු ඉහළ සතුටුදායක මට්ටමක පවතී. | සැලසුම් කර ඇති පරිදි ඉතිරි ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා නිසි සම්බන්ධීකරණය සහතික කිරීම කල යුතු වේ. |